# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## පුරාවිද්‍යාව හා සංස්කෘතික සංචාරණය – DHTC 22072

කාලය :- පැ 02

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) හා ප්‍රශ්න අටකින් (08) සමන්විත ය.

❖ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

### A කොටස

01. "මෙරට සිදුවන සංස්කෘතික සංචාරණයේදී පෞරාණික පුරාවිද්‍යා ස්මාරක කෙරෙහි මුඛ්‍ය අවධානයක් යොමුවේ." පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලාංකේය අභෞතික (අස්පර්ෂණීය) සංස්කෘතිකාංග කෙරෙහි විදේශීය සංස්කෘතික සංචාරකයකුගේ අවධානය දිනාගැනීමේ දී මුහුණු දීමට අපට සිදුවන අභියෝග හා ඒවා ජයගැනීමට යොදගත හැකි විවිධ උපක්‍රම පිළිබඳව අදහස් දක්වන්න.

03. පුරාවිද්‍යාවේ ක්‍රමික වර්ධනයේදී චාල්ස් ඩාවින් හා චාල්ස් ලයල්ගේ විද්‍යාත්මක චින්තනය මෙන්ම සී.ජේ. තොම්සන්ගේ හා ජැක් බුගේ ගේ දර්ශනික මතවාද ඇතිකළ බලපෑම අගයන්න.

04. පුරාවිද්‍යා ගවේශනය හඳුන්වා දී පූර්ව ගවේශන අවධියේ දී අවධානයට ලක්විය යුතු වැදගත් කරුණු ප්‍රමාණාත්මකව විග්‍රහ කරන්න.

### B කොටස

05. විදේශීය සංස්කෘතික සංචාරකයකුට සීගිරිය හා මිහින්තලේ පුරාවිද්‍යා ක්ෂේත්‍රවලින් මෙරට ඉපැරණි භෞතික හා අභෞතික සංස්කෘතිය පිළිබඳව විධිමත් අවබෝධයක් ලද හැකි වේ. ඔබ මෙම අදහසට එකඟ වන්නේද?

06. දේශීය හා විදේශීය සංස්කෘතික සංචාරකයන්ගේ සුවිශේෂී අවධානයට ලක්වන දඹුල්ලේ ඇති පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වැදගත්කම අගයන්න.

07. "සංස්කෘතිය" යන්නෙහි ගම්‍යවන මූලික අදහස පහද, විදේශීය සංචාරකයකුට මෙරට භෞතික හා අභෞතික සංස්කෘතිකාංග අවබෝධ කරගැනීමේ දී උගත් පළපුරුදු සංචාරක මාර්ගෝපදේශකයකුගේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

08. කෙටි සටහන් සපයන්න.
    1. මෙරට සෙල්ලිපි හා වංසකථාවල භාවිතා කොට ඇති කාල නිර්ණක්‍රම
    2. පුරාවිද්‍යාව හා ඉතිහාසය යන විෂයයන් අතර ඇති ප්‍රධාන වෙනස්කම්
    3. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට මෙරට අභෞතික සංස්කෘතිකාංග විදේශීය සංචාරකයන් අතර ප්‍රචලිත කිරීමට ඉටුකළ හැකි කාර්යභාරය

………………….

2023.02.01